## ධීවර අමාත්‍යාංශය

### විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

# ඇබෑර්තු

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | වැටුප් කේතය | පුරප්පාඩු සංඛ්‍යාව | සේවා ස්ථානය | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| 01 | **අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධනය** | HM 1-1 2016 | 01 | ප්‍රධාන කාර්යාලය | 81,670-15x2,270-115,720 |
| 02 | **සහකාර අධ්‍යක්ෂ (වෙරළබඩ)** | MM 1-3 2016 | 01 | ගාල්ල | 55,925 -10x1,375-15x1,910-98,325 |
| 03 | **සහකාර අධ්‍යක්ෂ (ව්‍යාප්ති)** | MM 1-3 2016 | 01 | කිලිනොච්චිය | 55,925-10x1,375-15x,1,910-98,325 |
| 04 | **සමාජ සංවර්ධන නිලධාරී** | JM 1-1 2016 | 01 | ප්‍රධාන කාර්යාලය | 42,600-10x755-18x1,135-70,580 |
| 05 | **දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී** | JM 1-1 2016 | 03 | පුත්තලම - 01<br>රත්නපුරය - 01<br>ත්‍රිකුණාමලය - 01 | 42,600-10x755-18x1,135-70,580 |
| 06 | **ජලජීවී විද්‍යාඥ** | JM 1-1 2016 | 18 | ඉගිනියාගල - 03<br>උඩවලව - 04<br>දඹුල්ල - 02<br>රම්බඩගල්ල - 03<br>බත්තුළුඔය - 01<br>ගිනිගත්හේන - 01<br>කහදමෝදර - 01<br>මඩකලපුව - 02<br>ඉරනමඩු - 01 | 42,600-10x755-18-1,135-70,580 |
| 07 | **භාෂා පරිවර්තක** | MA 4 - 2016 | 01 | ප්‍රධාන කාර්යාලය | 37,970-10x755-15x930-5x1,135-65,145 |
| 08 | **ජලජීවී වගා සහකාර** | MA 2-1 2016 | 05 | දඹුල්ල - 03<br>ඉගිනියාගල - 01<br>බත්තුළුඔය - 01 | 30,310-10x300-7x350-4x495-20x660-50,940 |
| 09 | **ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී** | MA 2-1 2016 | 12 | අම්පාර - 01<br>පොළොන්නරුව - 01<br>අනුරාධපුරය - 01<br>ත්‍රිකුණාමලය - 03<br>මාතලේ - 01<br>පුත්තලම - 01<br>වවුනියාව - 01<br>මුලතිව් - 01<br>කුරුණෑගල - 01<br>මොනරාගල - 01 | 30,310-10x300-7x350-4x495-20x660-50,940 |
| 10 | **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)** | MA 1-1 2016 | 03 | ගිනිගත්හේන - 01<br>මොනරාගල - 01<br>මඩකලපුව - 01 | 27,910-10x300-7x350-4x495-20x660-48,540 |
| 11 | **නේවාසිකාගාර පාලක** | MA 1-1 2016 | 01 | කලාවැව පුහුණු මධ්‍යස්ථානය - 01 | 27,910-10x300-7x350-4x495-0x660-48,540 |

## 01. අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)

**සුදුසුකම් හා පළපුරුද්ද - බාහිර**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය හා පශ්චාත් සුදුසුකම (මාස්ටර්ස්) සමග මානව සම්පත් හා පරිපාලන ක්ෂේත්‍රය ආශ්‍රිතව කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද තිබීම

හෝ

(ආ) පිරිස් කළමනාකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

(ඇ) මානව සම්පත් හා පරිපාලන ක්ෂේත්‍රය ආශ්‍රිතව කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් හා පළපුරුද්ද - අභ්‍යන්තර**

(අ) අධිකාරියේ I වන ශ්‍රේණියේ (MM) කළමනාකාර මට්ටමේ මානව සම්පත් / පරිපාලන ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසර 5 ක පළපුරුද්ද ලබා තිබීම

## 02. සහකාර අධ්‍යක්ෂ (ව්‍යාප්ති) සහ සහකාර අධ්‍යක්ෂ (වෙරළබඩ)

**සුදුසුකම් හා පළපුරුද්ද - බාහිර අපේක්ෂකයන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජෛව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ සත්ව විද්‍යාව හෝ ධීවර / ජලජීවී වගා යන ක්ෂේත්‍රයක විශේෂ උපාධියක් හෝ ආහාර විද්‍යාව සහ පෝෂණය / කෘෂිකර්මය / පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සමග රජයේ දෙපාර්තමේන්තුවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ජලජීවී වගාව / ධීවර කර්මාන්තය පිළිබඳව වසරක (01) පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද - අභ්‍යන්තර අපේක්ෂකයන්**

(අ) අධිකාරියේ ජලජීවී වගා / ව්‍යාප්ති / වෙරළබඩ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර ගණයේ (JM) තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

## 03. ජලජීවී විද්‍යාඥ සහ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී

**සුදුසුකම් හා පළපුරුද්ද - බාහිර අපේක්ෂකයන් සඳහා**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජෛව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ සත්ව විද්‍යාව හෝ ධීවර / ජලජීවී වගා යන ක්ෂේත්‍රයක විශේෂ උපාධියක් හෝ ආහාර විද්‍යාව සහ පෝෂණය / කෘෂිකර්මය / පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම

හෝ

(ආ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සුදුසුකම් හා පළපුරුද්ද - අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා**

(අ) බාහිර අපේක්ෂකයන් හට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

හෝ

(ආ) තනතුරට අදළ විෂය පථයේ "කළමනාකරණ සහකාර - තාක්ෂණික"(MA 2-1) II වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සාර්ථක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 04. සමාජ සංවර්ධන නිලධාරී

**සුදුසුකම් හා පළපුරුද්ද - බාහිර අපේක්ෂකයන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජ විද්‍යාව පිළිබඳ කලාවේදී උපාධිය

සහ

(ආ) පරිගණක සාක්ෂරතාවය

## 05. භාෂා පරිවර්තක - සිංහල - දෙමළ, ඉංග්‍රීසි - දෙමළ

**සුදුසුකම් හා පළපුරුද්ද**

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දෙමළ හා ඉංග්‍රීසි භාෂාව සඳහා විශිෂ්ට සාමාර්ථයක් ලබා තිබීම

සහ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

සහ

(ඇ) ඉංග්‍රීසි – දෙමළ භාෂා පරිවර්තන කටයුතු පිළිබඳ වසරක (01) පළපුරුද්ද

## 06. ජලජීවී වගා සහකාර සහ ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී

**සුදුසුකම්**

කෘෂිකර්ම / ජලජීවීවගා / පශු සම්පත් පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ජාතික වෘත්තීය කුසලතා 5 වන මට්ටමට නොඅඩු තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් බලය පවරන ලද හා පිළිගනු ලබන ආයතනයක් විසින් නිකුත් කරන ඕනෑම වෙනත් සහතිකයක් ලබා තිබීම

## 07. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන

**බාහිර අපේක්ෂකයන් - අධ්‍යාපන සුදුසුකම්**

(අ) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළුව විෂයන් හතරක් සඳහා සම්මාන සමග එකවර විෂයන් හයක් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සමත් වී තිබීම

සහ

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබීම

**අභ්‍යන්තර අපේක්ෂකයන් - අධ්‍යාපන සුදුසුකම්**

(අ) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරක් සඳහා සම්මාන සමග විෂන් හයක් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සමත් වී තිබීම

සහ

(ආ) ප්‍රාථමික මට්ටම (නුපුහුණු / අර්ධ පුහුණු / පුහුණු) – අධිකාරියේ අවම වශයෙන් වසර පහක සාර්ථක සේවාව සමගින්.

## 08. නේවාසිකාගාර පාලක

**බාහිර අපේක්ෂකයන් - අධ්‍යාපන සුදුසුකම්**

(අ) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව එකවර විෂයන් හයක් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සමත් වී තිබීම

සහ

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයන් - අධ්‍යාපන සුදුසුකම්**

(අ) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරක් සඳහා සම්මාන සමග විෂයන් හයක් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සමත් වී තිබීම

සහ

ප්‍රාථමික මට්ටම (අර්ධ පුහුණු) අධිකාරියේ අවම වශයෙන් වසර පහක අදාළ අංශයේ සාර්ථක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**පොදු කොන්දේසි :**

**වයස් සීමාව**

| අනු අංකය | තනතුර | වයස් සීමාව |
|---|---|---|
| 01 | **අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)** | වයස අවු. 35 ට අඩු නොවිය යුතු අතර, අවු. 55 ට වැඩි නොවිය යුතුයත |
| 02 | **සහකාර අධ්‍යක්ෂ (වෙරළබඩ)** | වයස අවු. 22 ට අඩු නොවිය යුතු අතර, අවු. 45 ට වැඩි නොවිය යුතුය. |
| 03 | **සහකාර අධ්‍යක්ෂ (ව්‍යාප්ති)** | |
| 04 | **සමාජ සංවර්ධන නිලධාරී** | |
| 05 | **දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී** | |
| 06 | **ජලජීවී විද්‍යාඥ** | |
| 07 | **භාෂා පරිවර්තක** | |
| 08 | **ජලජීවී වගා සහකාර** | වයස අවු. 18 ට අඩු නොවිය යුතු අතර, අවු. 45 ට වැඩි නොවිය යුතුය. |
| 09 | **ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී** | |
| 10 | **කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)** | |
| 11 | **නේවාසිකාගාර පාලක** | |

**සටහන :** උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයන් හා රජයේ / පළාත් පාලන දෙපාර්තමේන්තුවල / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයන්ට අදාළ නොවේ.

01. රජයේ / පළාත් පාලන දෙපාර්තමේන්තුවල / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

- ➢ අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- ➢ තනතුරට පැවරෙන වගකීම් ඉටු කිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා කායිකව හා මානසිකව මනා යෝග්‍යතාවයකින් සිටිය යුතුය. මූලිකව පත්වීම් ලබන සේවා ස්ථානයේ අවම වශයෙන් වසර පහක (05) කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතුය. (අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), භාෂා පරිවර්තක, සමාජ සංවර්ධන නිලධාරී හැර)
- ➢ මනා චරිතයකින් හෙබිය යුතුය.

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ලබාදෙන අනෙකුත් ප්‍රතිලාභ**

- ➢ වෛද්‍ය රක්ෂණ ප්‍රතිලාභ
- ➢ වෘත්තික දීමනා හා අනුමත කරන ලද තනතුරු සඳහා අනුමත කරන ලද අනෙකුත් දීමනා
- ➢ සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

**ඉහත සඳහන් තනතුරු සඳහා ඔබගේ අයදුම්පත් එවන විට පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.**

- ➢ ජීව දත්ත තොරතුරු
- ➢ සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්

02. සියලුම විස්තර පැහැදිලිව සඳහන් කරන ලද අයදුම්පත් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුරේ නම සඳහන් කර මෙම දැන්වීම පළකළ දිනයේ සිට දින 14 ක් ඇතුළත ලැබෙන පරිදි "සභාපති, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

**සභාපති,**

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**